**ශීර්ෂය 153 - ඉඩම් අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

**---------------------------------------------------------------------------------------**

ශීර්ෂ 153 - ඉඩම් අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුනි 06 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම.

**-----------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

**-------**

## 2.1 විසර්ජන ගිණුම

**-----------------**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

**------------------------------**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,482.43ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 2,292.72ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 1,189.71ක් හෙවත් සියයට 34.16 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 307.11 | 290.84 | 16.27 | 5.30 |
| මූලධන | 3,175.32 | 2,001.88 | 1,173.44 | 36.96 |
| **එකතුව** | **3,482.43** | **2,292.72** | **1,189.71** | **34.16** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 15301යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 16.00 | 15.51 | 6.00 | 8.21 | 50.00 | 38.26 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0383/0016/000 දරන අග්‍රිම ගිණුමෙහි 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 7.85 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ වන අංක 6000/0000/00/0015/0064/000 දරන පොදු තැන්පත් ගිණුමෙහි 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 0.47 ක් විය.

## 2.5 විගණන නිරීක්ෂණය

ඉඩම් අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3.** **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1** **විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.මිලියන 2.00 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම එම ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 3 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 ක සිට සියයට 52 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.2** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

විෂය අංක 15301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.395,308 ක්ද වී තිබුණි. එම හිඟ හිටි ණය ශේෂ වර්ෂ 2 ක සිට වර්ෂ 11 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණු නමුත් ඒවා අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**3.3.** **වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ)** **නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

වෙනත් ආයතන සතු වාහන 02 ක් වර්ෂ 02 ක සිට වර්ෂ 04 ක් දක්වා වූ කාල පරාසයක සිටද , අමාත්‍යාංශය සතු යතුරු පැදියක් වර්ෂ එකක කාලයක සිටද භාවිතා කිරීමෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ආ)** **ස්ථාවර වත්කම් සත්‍යාපනය**

අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන අදාළ ආයතනවලින් රු.135,057,176 ක් වටිනා ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබුණු අතර, එකී වත්කම්වල පැවැත්ම තහවුරු කිරීම සඳහා ඒවා සත්‍යාපනය කර නොතිබුණි.

**(ඈ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය සතු වාහන 39 ක් වර්ෂ 2 ක සිට වර්ෂ 13 ක් අතර කාල පරාසයක සිට දෙපාර්තමේන්තු 04 ක් විසින් පරිහරණය කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම වාහන විධිමත්ව එම දෙපාර්තමේන්තු වෙත පවරා දීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**3.4 බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු කාලයක සිට පැවත එන රු.72,856,513 ක් වූ බැරකම් විය. එම බැරකම්වලින් මුදල් රෙගුලාසි 94 ට පටහැනිව වැය විෂයයන් 06 කට අදාළව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.410,473 ක බැරකම්වලට එළඹ තිබුණි.

**3.5. කාර්යසාධනය**

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර ඒ පිළිබඳ නිරීක්ෂණ කීපයක් පහත පරිදි විය.

(i) ඉඩම් තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරිම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 20 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එහි මූල්‍ය ප්‍රගතිය සියයට 99 ක් වී තිබුණත්, භෞතික ප්‍රගතිය සියයට 50 ක් පමණක් වී තිබුණි.

(ii) ආපදා කළමණාකරණය සඳහා අංකිත භූමි ආකෘතියක් සැකසීම සඳහා 2016 වර්ෂයේදී රු. මිලියන 2 ක ප්‍රතිපාදන ඇතිකර තිබුණු නමුත් එම කාර්ය ඉටු කර නොතිබුණි.

(iii) ඉඩම් බැංකුව පිහිටුවීම සඳහා රු.මිලියන 500 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඒ සඳහා මිලියන 195 ක අග්‍රිමද නිදහස් කර තිබුණි. නමුත් එසේ නිදහස් කළ අක් මුදලින් සියයට 55.5 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(iv) ඉඩම් බැංකුව පිහිටුවීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ඉඩම් බැංකුව පිහිටුවීමේ ව්‍යාපෘතිය යටතේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 22 ක පත්ඉරු පරිලෝකනය කර පරිගණකගත කිරීම සඳහා 2016 වර්ෂයේදී සැලැසුම් කර තිබුණි. දිස්ත්‍රික්ක 09 කට අදාළව කාර්යාල 09 ක පමණක් එම කාර්ය ක්‍රියාත්මක කර තිබුණත්, එහි ප්‍රගතිය සියයට 41 ක් පමණක් වී තිබුණි.

- ඉඩම් ලේඛන පරිලෝකනය කර පරිගණකගත කිරීමේ කොන්ත්‍රාත්තුව රු. මිලියන 56.69 කට පෞද්ගලික ආයතනයක් වෙත පිරිනමා තිබුණි. එම කාර්යය සඳහා 2016 ජූලි 07 දින ගිවිසුම් අත්සන් කර තිබුණු අතර ගිවිසුම අනුව 2016 අගෝස්තු 21 දින කාර්යයන් ආරම්භ කිරීමටද, 2016 දෙසැම්බර් 31 දින වන විට කාර්යයන් අවසන් කිරීමටද සැලසුම් කර තිබුණි. එසේ වුවද මෙම කාර්ය නියමිත කාලසීමාව තුළ අවසන් කිරීමට නොහැකි වී තිබුණු අතර, පලමු කාලය දීර්ඝ කිරීම 2017 ජනවාරි 31 දක්වාද, දෙවන දීර්ඝ කිරීම 2017 ජුනි 30 දක්වාද වී තිබුණි.

- පරිලෝකනයට අදාළ දත්ත ඇතුළත් කිරීමේ එක් මෘදුකාංගයක් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් සකස් කර තිබුණි. මෘදුකාංගය ක්‍රියා කිරීමේදී එහි ධාරිතාව ප්‍රමාණවත් නොවන නිසා දත්ත ඇතුළත් කිරීමට නොහැකි වී තිබූ බවත්, පද්ධතියේ පවතින මන්දගාමී බව නිසා දත්ත ඇතුළත් කිරීම යම් අවස්ථාවල නැවතී තිබුණු බවත් අදාළ පෞද්ගලික ආයතනය විසින් වාර්තා කර තිබුණි. මේ අනුව ගිවිසගත් කාලය තුළ කාර්යයන් ඉටු නොකිරීමට හේතු ලෙස පද්ධතිය මන්දගාමී වීමත්, මන්දගාමී වීමට හේතු ලෙස දත්ත ඇතුල් කරන්නන් 30 කට අධික සංඛ්‍යාවක් පද්ධතිය තුළ එක වර ප්‍රවේශ වී සිටීම, දිවා රාත්‍රී දෙකේම දත්ත ඇතුළත් කිරීම, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායනය (ICTA) විසින් ඉඩම් දත්ත කළමණාකරණයට අදාළ වෙනස්වීම් සිදු නොකිරීම යන හේතු දක්වා තිබුණි. මේ අනුව මෙම ප්‍රමාදයට අදාළව නියෝජිතායතනයේ දායකත්වයේ සිදු වූ අඩුපාඩුකම් හඳුනාගෙන තිබුණි.

(v) උගත් පාඩම් ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරිම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 50 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 24 ක් උපයෝජනය කර පසු රු.මිලියන 26 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- උතුරු නැගෙනහිර ඉඩම් ගැටලු විසඳීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට රු.මිලියන 20 ක් හා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට රු.මිලියන 10 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඒ සම්බන්ධ වියදම් වාර්තා හෝ තහවුරු කිරීමට අදාළ වාර්තා හෝ ලේඛන කිසිවක් අමාත්‍යාංශය සතුව නොතිබුණි.
- ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට ලබා දුන් රු.මිලියන 10 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 5 ක් ප්‍රධාන කාර්යාලයේ රඳවා ගෙන ඉතිරි රු.මිලියන 5 ක් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මුදා හැර තිබුණි. ප්‍රධාන කාර්යාලයේ රඳවා ගනු ලැබූ රු.මිලියන 5 කින් රු.853,181 ක් පමණක් වැය කර රු.4,146,819 ක් ඉතිරි කර තිබුණි. වැය කරන ලද මුදලින් උතුරු නැගෙනහිර ගැටලු සම්බන්ධ ලිපි සිංහල භාෂාවට පරිවර්තනය කිරීමේ ගාස්තු වශයෙන් වැඩිම වියදමක් සිදු කර තිබුණි.

(vi) ඉඩම් අත්පත් කරගැනීම් අංශයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ දැනට ක්‍රියාත්මක වන ඉඩම් අත්පත් ලිපිගොනු සංඛ්‍යාව 18841 ක් වූ අතර ඉන් වන්දි ගෙවා වැඩ අවසන් කර

තිබුණු ගොනු සංඛ්‍යාව 236 ක් පමණක් වී තිබුණි. තවද, අතහැර දැමූ අක්‍රීය ලිපිගොනු සංඛ්‍යාව 401 ක් වී තිබුණි.

- 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය ප්‍රකාරව අතුරු විධාන ආඥාව නිකුත් කර අවසන් කර තිබුණු ගොනු සංඛ්‍යාව 1168 ක් වූ අතර වන්දි ගෙවා වැඩ අවසන්කර තිබූ ගොනු සංඛ්‍යාව 236 ක් වී තිබුණි.

- 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය ප්‍රකරව අතුරු විධාන ආඥාව යටතේ අත්පත් කර ගන්නා ලද ඉඩම් සම්බන්ධයෙන් කඩිනමින් වන්දි මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් වැඩි පොලී වටිනාකමක් ගෙවීමට සිදු වී තිබුණි. 2016 වර්ෂයේදී ඉඩම් අත්පත් කර ගැනිමේ වන්දි ලෙස රු. 697,586,929 ක් ගෙවීමේදී ලිපිගොනු 55 ක් සඳහා පොලී ලෙස රු.160,002,470 ක් ගෙවීමට සිදු වී තිබුණි. මෙලෙස ගෙවනු ලැබූ පොලී මුදල් සම්බන්ධයෙන් ඉඩම් අත්කර ගන්නා ලද වර්ෂයන් පිළිබඳ කාල විශ්ලේෂණය පහත පරිදි විය.

| **ඉඩම් අත්කර ගත් කාල පරිච්ඡේදය** | **ගෙවූ පොලීය** |
|---|---|
| | රු. |
| 1976-1995 | 48,673,478 |
| 1996-2005 | 71,379,957 |
| 2006-2014 | 39,949,035 |
| **එකතුව** | **160,002,470** |

**(ආ) සැලැසුම් කිරීම**

වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව අදාළ ව්‍යාපෘතිවල කටයුතු මෙහෙයවා නොතිබුණු අතර ඒ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) බිම්සවිය වැඩසටහන**

බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරික්ෂා කිරිමේදී සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ 03 ක දත්තවලට අනුව සලසා තිබුණු ප්‍රතිපාදන පූර්ණ වශයෙන් උපයෝජනය කර නොතිබුණි. ඒ අනුව නිකුත් කිරීමට ඉලක්කගත හිමිකම් සහතික සංඛ්‍යාවට ලඟාවීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි. විස්තර පහත පරිදි විය.

| වර්ෂය | ප්‍රතිපාදනය | වියදම | ඉලක්කගත හිමිකම් සහතික ප්‍රමාණය | මැනුම් කරන ලද බිම් කැබලි සංඛ්‍යාව | නිර්දේශ කර අනුමත කරන ලද සංඛ්‍යාව | ගැසට් පතුයේ පල කරන ලද තීරණය ප්‍රසිද්ධ කිරිම් සංඛ්‍යාව | පුද්ගලයින් විසින් ලබාගෙන ඇති හිමිකම් සහතික ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| ------- | ------------ | ----------- | ----------- | --------- | ------------ | ------------ | ----------------- |
| | රු. මිලියන | රු.මිලියන | | | | | |
| 2013 | 800 | 668.0 | 135,000 | 110,630 | 71,315 | 58,690 | 28,402 |
| 2014 | 400 | 445.0 | 122,090 | 122,239 | 53,448 | 66,759 | 24,242 |
| 2015 | 546 | 413.0 | 206,580 | 83,957 | 51,475 | 53,484 | 29,043 |
| 2016 | 500 | 362.6 | 45,000 | 133,727 | 60,830 | 59,880 | 21,872 |
| | බි | | සංශෝධිත | | | | |

මසවිය වැඩසටහනෙහි 2016 වර්ෂයේ ප්‍රගතිය පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂයේදී නිකුත් කිරීමට ඉලක්කගත හිමිකම් සහතික ප්‍රමාණය 100,000 ක් වී තිබුණි. එසේ වුවද, මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් වරින් වර සිදු කරන ලද සංශෝධනයන්ට අනුව 2016 අගෝස්තු මාසයේදී එම ඉලක්කය 45,000 ක් ලෙස සංශෝධනය කර තිබුණි.
- සමාලෝචිත වර්ෂයේ මාස 6 ක කාලයක් ඉකුත් වීමෙන් පසුව හිමිකම් සහතික නිකුත් කළ යුතු ප්‍රමාණයේ ඉලක්ක ගත ප්‍රමාණය 40,000 ක් ලෙස සංශෝධනය කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසානයේදී එම ඉලක්කගත සහතික පත්‍ර ප්‍රමාණයෙන් සහතික පත්‍ර 35,031 ක් පමණක් නිකුත් කර තිබුණි.
- ලියාපදිංචි හිමිකම් සහතික ප්‍රමාණය වූ 35,031 කින් පුද්ගලයින් විසින් ලබාගෙන තිබුණු හිමිකම් සහතික ප්‍රමාණය 21,872 ක් පමණක් වී තිබුණි. එය ලියාපදිංචි හිමිකම් සහතික පත්‍ර ප්‍රමාණයෙන් සියයට 62 ක් වී තිබුණි.

**(ii) ඉඩම් අත්පත් කර ගැනීම.**

----------------------------------

ඉඩම් අත්පත් අංශය 2016 වර්ෂයේදී භෞතික වශයෙන් ඉඩම් 244 ක් අත්පත් කරගැනිමට සැලසුම් කර තිබුණත්, ඉඩම් 134 ක් හෙවත් අත්පත් කර ගැනීමට අපේක්ෂිත ඉඩම් ප්‍රමාණයෙන් සියයට 55 ක් පමණක් අත්පත් කරගෙන තිබුණි.

**(iii) උගත් පාඩම් කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරිම**

-------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ඉඩම් ගැටළු 20,000 ක් විසඳීම සඳහා "ප්‍රාදේශීය කොට්ඨාශ දින" පැවැත්වීමටද, ගැටළු 1000 ක් විසඳීම සඳහා ජංගම සේවා පැවැත්වීමටද, ඉඩම් ලියවිලි 15,000 ක් ලබාදීම සඳහා ඉඩම් කච්චේරි පැවැත්වීමටද සැලසුම් කර තිබුණු අතර සමාලෝචිත

වර්ෂය අවසානයේ එහි භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 48 ක්, සියයට 47 ක් හා සියයට 99 ක් වී තිබුණි.

- මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් 80 ක් පැවැත්වීමටත්, කාර්ය මණ්ඩලයේ නිලධාරින් 400 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමටත් සැලැසුම් කර තිබුණු නමුත් එම කිසිදු වැඩසටහනක් පවත්වා නොතිබුණි.

**(ඇ) පනත් සංශෝධනය කිරීම්**

**---------------------------**

ඉඩම් ක්ෂේත්‍රයට බලපානු ලබන අණපනත් යාවත්කාලීන කර පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පවතින අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) ඉඩම් සංවර්ධන ආඥා පනත**

**------------------------------**

ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත 2008 වර්ෂයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි. කෙටුම්පත සඳහා වූ සංශෝධන වරින්වර ඉදිරිපත් කර තිබුණු අතර, නීතිපති සිදු කළ සංශෝධන ඇතුළත් කෙටුම්පත 2015 පෙබරවාරි 26 දින නීති කෙටුම්පත් සම්පාදක විසින් අමාත්‍යාංශය වෙත යොමු කර තිබුණි. නිරීක්ෂණ සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කිරීමෙන් අනතුරුව ඒ සඳහා වූ නව සංශෝධන 2016 ඔක්තෝබර් 18 දින නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කර තිබුණි. මේ අනුව 2008 වර්ෂයේ සිට 2017 මැයි 31 දින වන විට වර්ෂ 8 ක කාලයක් ඉකුත් වී තිබුණු නමුත්, ඉඩම් සංවර්ධන ආඥා පනතෙහි සංශෝධනය නිම කිරීමට නොහැකි වී තිබුණි.

**(ii) ඉඩම් අත්පත් කරගැනීමේ පනත**

**---------------------------------**

1950 අංක 9 දරන ඉඩම් අත්පත් කරගැනීමේ පනත සංශෝධනය සඳහා 2002 වර්ෂයේ සිට සාකච්ඡා කර තිබුණු අතර, 2005 වර්ෂයේදී අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ පනත් සංශෝධන යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ කෙටුම්පතක් සම්පාදනය සඳහා අනුමැතිය ලබා දී තිබුණි. මේ අනුව නීතිපතිවරයා විසින් සංශෝධන ඇතුළත් මූලික කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් 2006 වර්ෂයේදීද, සංශෝධිත කෙටුම්පත 2008 වර්ෂයේදීද අමාත්‍යාංශය වෙත යොමු කර තිබුණි. 2016 පෙබරවාරි මාසයේදී නව සංශෝධනයක් සම්බන්ධව සාකච්ඡා වටයක් පවත්වා තිබුණු අතර, 2016 ජූනි මාසයේදී පනත සංශෝධනය සඳහා අමත්‍යවරයා ඉදිරිපත් කර අමාත්‍ය මණ්ඩලයේ සංදේශය මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සමඟ ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාවේ නිර්දේශ ලබා ගැනිම සඳහා යොමු කර තිබුණි. මේ අනුව 2002 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වර්ෂ 14 ක කාලයක් තුළ ඉඩම් අත්පත් කර ගැනීමේ පනත සංශෝධනය වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

**3.6 කළමණාකරණ දුර්වලතා**

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ) රජයේ විවිධ ව්‍යාපෘති වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීම.**

---------------------------------------------------------------

රජයේ විවිධ ව්‍යාපෘති වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේදී පහත සඳහන් කළමනකාරණ දුර්වලතාවන් අනාවරණය විය.

(i) කරාපිටිය මෝදර නව මාතෘ රෝහල සඳහා හෙක්ටයාර 0.742 ක ඉඩම් අත්පත් කරගැනීම වෙනුවෙන් රු.74,367,500 ක වන්දියක් හා රු.32,655,750 ක පොලියක් ඒ වෙනුවෙන් ගෙවා තිබුණි. එම ඉඩම සඳහා 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය ප්‍රකාර අතුරු විධානය ප්‍රසිද්ධ කර 2008 ජනවාරි 10 දින භුක්තිය භාරගෙන තිබුණු නමුත් වන්දි ගෙවීමට වර්ෂ 6 ක කාලයක් ගත කර තිබුණි. මැනුම් කටයුතු අවසන් කර පිඹුරුපත් එවීමට වර්ෂ $2\frac{1}{2}$ ක කාලයක් ගත වී තිබීම නිසා වන්දි ගෙවීම ප්‍රමාද වීමට ප්‍රධාන වශයෙන්ම බලපා තිබුණි. එසේම භුක්තිය භාරගැනීමෙන් පසු 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 5 වගන්තිය යටතේ ප්‍රකාශය ගැසට් පත්‍රයේ පල කර ප්‍රසිද්ධ කිරීමටද මාස 10 ක පමණ කාලයක් ප්‍රමාද වී තිබුණි. මෙම ප්‍රමාද වීම් වලක්වා ගැනිම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) වේරුස්සගහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ අත්තිඩිය බෙල්ලන්තර වෙල්යායේ වැසි ජලය තාවකාලික ලෙස එක්රැස් කර තැබීම පිණිස ජල රක්ෂිතයක් සකස් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට රු.139,500,000 ක වන්දියක් හා ඒ සඳහා රු.21,264.514 ක පොලියක් ගෙවා තිබුණි. මේ සඳහා 2013 ඔක්තෝබර් 04 දින ගැසට් පත්‍රයේ පල කරන ලද 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 5 වගන්තියේ ඇතුළත් නිවේදනය ගැසට් පත්‍රයේ පල කර අත්පත් කර ගන්නා නිලධාරීන් විසින් ග්‍රාමසේවා නිලධාරින් වෙත එම වාර්තා යවා ප්‍රදර්ශනය කිරීමට වර්ෂයකට අධික කාලයක් ප්‍රමාද කර තිබුණි. මෙම ඉඩමේ මූලික පිඹුරුද 2014 අප්‍රේල් 01 දින ලැබී තිබුණත් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ එම දැන්වීම පල කර හිමිකම් පරීක්ෂණ පවත්වා කඩිනමින් වන්දි ගෙවීම කළ යුතුව තිබුණත්, ඒ සඳහා වර්ෂයක පමණ කාලයක් ප්‍රමාද කර තිබුණි. මේ අනුව වන්දි ගෙවීම සඳහා වූ මුළු ප්‍රමාදය වර්ෂ 2ක් හා මාස 2 ක් ගෙන තිබුණි.

(iii) නුවරඑළිය ජනාධිපති මන්දිරය ආසන්නයේ ශාන්ත ඩ්‍රයිව් පාරේ පිහිටා ඇති අක්කරයක් පමණ වූ ගොඩනැගිල්ලක් හා ඉඩම අත්කර ගැනිම සඳහා රු.98,000,000 ක වන්දියක්ද, රු.42,013,584 ක වන්දිය වෙනුවෙන් වූ පොලියක්ද ගෙවා තිබුණි. ඉඩමේ භුක්තිය භාරගෙන වන්දි ගෙවීම සඳහා වර්ෂ 6 ක කාලයක් ගත වී තිබුණු අතර, ඉඩම සඳහා වූ හිමිකම් පරීක්ෂණ පැවැත්වීමට වර්ෂ 2 මාස 05 ක පමණ කාලයක් ප්‍රමාද කර තිබුණි.

(iv) කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ගල්කන්ද වත්තෙහි අක්කර 1 පර්චස් 28 ක ඉඩම සඳහා රු. 5,650,000 ක වන්දියක් හා රු.3,210,593 ක් වටිනා පොලියක් ගෙවා තිබුණි. මෙම ඉඩම අත්පත් කර ගැනීමේ කාර්යය 2006 වර්ෂයේදී

ආරම්භ වී තිබුණු අතර 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය ප්‍රකාරව අතුරු විධානය 2007 නොවැම්බර් 19 දිනැති ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 5 වගන්තිය යටතේ වූ ප්‍රකාශය 2008 ජුනි 04 දින ප්‍රකාශයට කර තිබුණි. නමුත් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වගන්තිය අනුව දැනුම්දීම 2012 ජූලි 18 දින ප්‍රකාශයට පත්කර තිබුණි. ඒ වන විට වර්ෂ 4 ක ප්‍රමාදයක් සිදු වී තිබුණි.

(v) මහ කොළඹ ගංවතුර පාලනය කිරීමේ හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ කෝට්ටේ ඇළ සංවර්ධනය සඳහා ඉඩම් අත්කර ගැනීමේදී කැබලි 21 කින් යුක්ත ඉඩම සඳහා කැබලි 05 ක් හැර ඉතිරි කැබලි සඳහා 2003 වර්ෂය අවසාන වන විට වන්දි ගෙවා අවසන් කර තිබුණි. හිමිකම් තීරණය කළ නොහැකි ඉඩම් කැබලි 05 ක් වෙනුවෙන් වන්දි මුදල් 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 33 වගන්තිය ප්‍රකාරව අධිකරණයේ තැන්පත් කිරීමට කටයුතු කළ යුතුව තිබුණි. මෙම ඉඩම් කැබලි 05 සඳහා 2008 වර්ෂයේදී ප්‍රතිපාදන නිදහස් කර තිබුණත් අක් මුදල් නොලැබීම මත වන්දි මුදල් අධිකරණයේ තැන්පත් කිරීමට නොහැකි වී තිබුණි. නැවත ප්‍රතිපාදන 2008 වර්ෂයේදී ඉල්ලුම් කර තිබුණත්, එදින සිට තවත් වර්ෂ 4 ක ප්‍රමාදයෙන් පසු 2012 ජූලි මාසයේදී ප්‍රතිපාදන ඉල්ලා තිබුණි. ඒ අනුව ප්‍රතිපාදන ලබා ගැනීම ප්‍රමාදවීම හේතුවෙන් රු. 3,147,600 කට අධික මුදලක් පොලී වශයෙන් රජයට වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

(vi) ඉඩම් අත්පත් කරගැනීම සඳහා වන්දි සහ පොලී ගෙවීම සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත දුර්වලතා නිරීක්ෂණය විය.

- කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නාවික හමුදා කඳවුර සඳහා ඉඩම් අත්පත් කරගැනීම වෙනුවෙන් අමාත්‍යාංශය විසින් රු.102,000,000 ක ප්‍රතිපාදන 2016 ජුනි 30 දින නිදහස් කර තිබුණද, 2016 දෙසැම්බර් 30 දින වන විට රු.26,355.801 ක අක් මුදලක් පමණක් නිදහස් කර තිබුණි. ඉතිරි මුදල වන රු.65,275.000 ක් සඳහා විගණන දිනය වූ 2017 පෙබරවාරි 15 දින වන විටත් ප්‍රතිපාදන නැවත ඉල්ලුම් කර මුදල් නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව ප්‍රතිපාදන නිදහස් කර මාස $7\frac{1}{2}$ ක් ගත වී තිබුණද, එම මුදල ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර එම කාල පරිච්ඡේදය සඳහා පමණක් රු.2,855,781 ක පොලියක් ගෙවීමට සිදු වි තිබුණු බව නිරීක්ෂණය විය. එසේම අමාත්‍යාංශය විසින් එක් එක් කාරණයට අදාළව නිදහස් කළ වන්දි මුදල් ගෙවීම් පිළිබඳ විස්තර වාර්තා කර නොතිබුණි.

- ඉඩම් අත්පත් කරගැනීම් සම්බන්ධයෙන් ප්‍රතිපාදන නිදහස් කිරීමේදී අදාළ ලිපි ගොනු අංකය යටතේ අත්පත් අංශයෙන් අදාළ ආයතනය සහ අමාත්‍යාංශයේ ගිණුම් අංශය වෙත දන්වන අතර භාණ්ඩාගාර මුද්‍රිතය අනුව වියදම අදාල වැය ශීර්ෂයට හර කිරීම සිදු කරනු ලැබේ. ඒ අනුව අදාළ ගොනු අංකය සඳහා නිදහස් කළ මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කිරීම පිළිබඳව පරීක්ෂා කිරීමට හැකියාවක් නොතිබුණි. මේ අනුව අමාත්‍යාංශය විසින් නිදහස් කරනු ලැබූ ප්‍රතිපාදනවලින් කවර ආයතනයක් විසින් හෝ එම ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

(vii) සීතාවක කාර්මික ජනපදයට පිවිසෙන කුඩගම මාර්ගය පුළුල් කිරීමට ඉඩම් අත්පත් කරගැනීම සඳහා බස්නාහිර පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය, බස්නාහිර පළාත්

ප්‍රවාහන මහා මාර්ග, නිවාස, ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින් සමූපකාර, පළාත් සභා, පළාත් පාලන හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම අමාත්‍යාංශය විසින් ඉඩම් අමාත්‍යාංශය වෙත අයදුම් පත්‍රයක් 1996 ජූලි 18 දින ඉදිරිපත් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මෙම ඉඩම සඳහා 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය ප්‍රකාරව අතුරු විධානය 1997 අප්‍රේල් 04 දින ගැසට් පත්‍රයේ පල කර තිබුණි. 2008 ජූලි 01 දින වන විට වන්දි ප්‍රදාන ලිපි යවා තිබුණි. මෙම ඉඩම සඳහා වන්දි ගෙවීමට අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින් වැය කිරීමට අයවැය අධ්‍යක්ෂ අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වීම නිසා 2015 ජූලි මාසය වන විටත් එම වන්දි ගෙවා නොතිබුණි.

(viii) ප්‍රමාදය සැලකූ විට අත්පත් කරගත් ඉඩම්වල හිමිකරුවන්ට වන්දි මුදල් නොලැබීම නිසා පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කළ පැමිණිලි අනුව 2011 ජනවාරි 05 දින වන විට මාස 02 ක් තුළ වන්දි මුදල් ගෙවීමට නිලධාරීන් එකඟ වී තිබුණි. ඒ සඳහා 2015 ඔක්තෝබර් මාසය වන විට වසර 04 කට අධික කාලයක් ප්‍රමාද කර ගෙවීම් කර තිබුණි. එසේම ඉඩම් සඳහා වූ හිමිකම් පරීක්ෂණ සඳහා වර්ෂ 08 ක කාලයක් ගත කර තිබුණි.

(ix) වන්දි ගෙවීම සඳහා ප්‍රතිපාදන සැලැසීමේදී කුමන ආයතනයක් විසින් සිදුකළ යුතු ද යන ගැටළුව ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේදී හඳුනාගෙන නොතිබීම නිසා ප්‍රතිපාදන සැලැසීමේදී කඩිනමින් සිදු නොවීම නිසා ද 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය ප්‍රකාරව අතුරු විධානය නිකුත් කළ දින සිට වන්දි ගෙවූ දිනය වූ 2015 ඔක්තෝබර් 28 දින දක්වා පොලිය ලෙස රු.8,635,112 ක් ගෙවීමට තිබුණි. ඊට අදාළ වන්දිය ලෙස රු.7,542,800 ක් ගෙවීමට සිදු වී තිබුණි. මේ අනුව වන්දි මුදලට වඩා වැඩි පොලියක් ගෙවීමට සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(x) මහ කොළඹ ජලය බැස්සවීමේ හා ඇළමාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා නුගේගොඩ නාවල ගොරොක්ගහකුඹුර සහ ගොරොක්ගහඹිට්ට යන ඉඩමෙන් අක්කර 10 ක ප්‍රමාණයක් අත්කර ගැනීම ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් ඉටු කළ යුතුව තිබුණි. එම ක්‍රියාවලිය 1991 මැයි 09 දින ආරම්භ කර තිබුණු අතර එම ඉඩම පවරා ගැනීම සඳහා 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය ප්‍රකාරව අතුරු විධාන යටතේ වූ ආඥාව නිකුත් කර තිබුණි. එම ඉඩම සම්බන්ධයෙන් හිමිකම් පරීක්ෂණ පවත්වා සම්පූර්ණයෙන් වන්දි මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි. ලොට් අංක 05 හි පර්චස් 386 ක කොටසක් සඳහා වර්ෂ 24 ක ප්‍රමාදයකින් පසු 2015 දෙසැම්බර් 29 දින රු.2,128,855 ක් වන්දි වශයෙන් හා එහි පොලිය වශයෙන් රු.3,603,764 ක් ගෙවා තිබුණි. අනෙක් ඉඩම් කොටස් සඳහා 2017 ජනවාරි 31 දින වන විටත් මුදල් ගෙවීමට හෝ හිමිකම් ඉදිරිපත් නොවූ ඉඩම් කොටස් සඳහා අදාළ වන්දි මුදල උසාවියේ තැන්පත් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**(ආ) කන්තලේ සීනි කර්මාන්තායතනය නව ආයෝජකයෙකුට පැවරීම**

**-------------------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉඩම් අමාත්‍යාංශය වෙත කන්තලේ සීනි කර්මාන්තායතනය භාරදෙන අවස්ථාව වන විට රු.76,352,246 ක හිඟ විදුලි බිල් පතක් ගෙවීමට තිබුණු අතර, එම මුදල කඩිනමින්

ගෙවීමට කටයුතු නොකළහොත් නීතිමය ක්‍රියාමාර්ගයකට යොමු වන බව ලංකා විදුලි බල මණ්ඩලය දක්වා තිබුණද, ඒ සම්බන්ධයෙන් විසඳුමකට එළඹ නොතිබුණි.

(ii) කිසිදු නිෂ්පාදන හෝ වෙනත් කාර්යයක් සිදු කර නොතිබුණද, කන්තලේ සීනි කර්මාන්ත ආයතනයේ ප්‍රධාන කාර්යාලය ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් ගොඩනැගිල්ලක කාමර 2 ක පවත්වා තිබුණු අතර ඒ සඳහා මාසිකව රු.25,000 ක කුලියක් ගෙවා තිබුණි.

(iii) කන්තලේ සීනි කර්මාන්තයේ ආයතනික ලැබීම්, ගෙවීම් සටහන් අනුව 2016 වර්ෂයේදී අමතර ආදායම් උත්පාදන මාර්ග ලෙස වැලි විකිණීම, වැව් බදු දීම, ගෙවල් විකිණීම හා වෙනත් ආදායම් ලෙස රු. 468,811 ක් රැස් කර තිබුණි. ඒ සඳහා වූ විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණු අතර, ඒ සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක්ද සිදු කර නොතිබුණි.

**3.7 පාඩු හා අලාභහානි**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයට අයත් වාහන දෙකක් 2015 ඔක්තෝබර් මාසයේදී හා 2015 මාර්තු මාසයේදී කාර්මික දෝෂ හේතු කොටගෙන ධාවනයෙන් ඉවත් කර තිබුණි. 2017 ජුනි 30 දින වන විටත් ඒ සම්බන්ධයෙන් සුදුසු පියවරක් ගෙන නොතිබුණි. එසේම තවත් වාහනයක් 2016 මැයි මාසයේදී ජලයට යට වී තිබුණු අතර මාස 07 ක ප්‍රමාදයකින් පසු 2017 ජනවාරි මාසයේදී එය අලුත්වැඩියාව සඳහා යොමු කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 110(2) ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. 2016 වර්ෂයේදී අමාත්‍යාංශය සතු වාහන 2 කට සිදු වී තිබුණු අලාභහානිය එහි ඇතුළත් කර නොතිබුණත් විසර්ජන ගිණුමේ පාඩු හා අත්හැරීම් ප්‍රකාශයේ සඳහන් කර තිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

----------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 20 | 3 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 1 |
| (iii) | ද්විතියික මට්ටම | 447 | 408 | 39 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 52 | 47 | 5 |
| | **එකතුව** | **526** | **478** | **48** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2016 දෙසැම්බර් 31 දිනට විමර්ශන සහකාර ( ඉඩම් අත්පත්) / සංවර්ධන නිලධාරී කාර්ය මණ්ඩලයෙහි 358 දෙනෙක් වූ අතර එම නිලධාරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 207 ක් යටතේ අනුයුක්ත කර තිබුණි. මෙම නිලධාරින්ගේ කාර්යභාරයට අදාළ කාර්යසාධනය සම්බන්ධව විස්තරාත්මක වාර්තා නොතිබුණි. නිලධාරින්ගේ වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම්, කාර්යසාධනය ඇගයීම් වැනි කාර්යයන්වලදී අමාත්‍යාංශය සලකා බලනු ලැබූ කරුණු පැහැදිලිව දක්වා නොතිබුණි. මෙම නිලධාරින් සඳහා වැටුප් දීමනා හා ගමන් වියදම් ලෙස 2016 වර්ෂයේදී රු.12,682,302 ක් වැය කර තිබුණි.